C

# නිවේදනය

ගරු මන්ත්‍රීවරුනි, 2024 අයවැය කාරක සභා අවස්ථාවේ වැඩසටහනෙහි පරිසර අමාත්‍යාංශයේ, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අමාත්‍යාංශ වැය ශීර්ෂ විවාදයට ගැනීමට නියමිතව තිබූ දින සංශෝධනය කර තිබෙන බැවින් එකී ප්‍රතිශෝධිත දින පිළිබඳව මෙම ගරු සභාව දැනුම්වත් කිරීමට කැමැත්තෙමි.

- 2023 නොවැම්බර් 27 සඳුදා විවාදයට ගැනීමට නියමිතව තිබූ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ 2022 දෙසැම්බර් 02 සෙනසුරාදා දිනද;
- 2023 දෙසැම්බර් 02 සෙනසුරාදා විවාදයට ගැනීමට නියමිතව තිබූ අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ 2023 දෙසැම්බර් 05 අඟහරුවාදා දිනද;
- 2023 දෙසැම්බර් 05 අඟහරුවාදා විවාදයට ගැනීමට නියමිතව තිබූ පරිසර අමාත්‍යාංශයේ සහ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ 2023 නොවැම්බර් 27 සඳුදා දිනද;

විවාදයට ගැනීමට නියමිත බවත්, එකී සංශෝධන ඇතුළත් ලිපියක පිටපතක් සෑම මන්ත්‍රීවරයෙකුගේම සභා මේසය මත මේ වනවිටත් තබා තිබෙන බවත්, කාරුණිකව දන්වා සිටිමි.